**අකුරැස්ස ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
---------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) පැරණි සභා ගොඩනැගිල්ලේ රු.386,800 ක වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමේදී එය පිහිටි ඉඩමේ වටිනාකමද, ස්ථාවර වත්කම්වලින් ඉවත් කර තිබුණි.

(ආ) පුරනැගුම ව්‍යාපෘතිය යටතේ වැඩ අවසන් කර තිබූ ගොඩනැගිල්ලේ රු.33,961,279 ක් වූ පිරිවැය වටිනාකම ගිණුම්ගත නොකර, රු.34,039,605 ක් වූ කොන්ත්‍රාත් වටිනාකම ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාළව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.4,342,204 ක් හා ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.612,500 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.5,037,907 ක දායක මුදල ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඉ) සභාවට අයත් ඉඩම් කැබලි 27 ක වටිනාකම ගණනය කර ප්‍රාග්ධනිත කර නොතිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.29,562,465 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු.4,592,467 ක් වූ අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.14,044,165 ක් වූ ප්‍රාග්ධන ආධාර ණයගැති ශේෂය තුළ, අවුරුදු 03 ක කාලයක් ඉක්ම වූ රු.2,314,236 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.16,048,407 ක් වූ ණයහිමි ශේෂය තුළ අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබූ රු.3,205,760 ක් වූ ශේෂ ඇතුළත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.4,937,784 ක් වූ තැන්පතු ශේෂය තුළ වසර 03 කට වැඩි කාලයක් ඉක්මවූ රු.2,917,670 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට පෙර සිට නිරවුල් නොකර ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.760,510 ක් වූ අතුරලිය ප්‍රාදේශීය සභා ණයගැති ශේෂය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.70,655,848 ක් වූ ස්ථාවර වත්කම් සහ එකතුව රු.14,525,058 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂ සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද විස්තරාත්මක උපලේඛනය, රු.3,420,166 ක් වූ ගබඩා තොග ශේෂ සම්බන්ධයෙන් තොග සමීක්ෂණ වාර්තා හා එකතුව රු.4,351,529 ක් වූ තැන්පතු වර්ග 06 ක් සම්බන්ධයෙන් විස්තරාත්මක උපලේඛණ යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 570 හා 571 රෙගුලාසිවලට අනුව එකතු වටිනාකම රු.2,406,380 ක් වූ කාලය ඉක්ම වූ තැන්පතු ශේෂ 06 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.17,834,074 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.8,752,279 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,081,795 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 72 ක් තරම් මුළු පුනරාවර්තන වියදම් පැවතුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම්වල අඩු වීමක් පෙන්නුම් කෙරේ ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී මෙන්ම ඉකුත් වර්ෂ දෙකෙහිද සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් පැවති අතර, සභාවේ ස්වයං උත්පාදිත ආදායම් මගින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් නොහැකි තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාතයන් 1:3 ක් ලෙස දැක්වුණද, ණයගැති ශේෂය තුළ වසර 03 ක කාලයක් ඉක්මවා අය නොවී පවතින රු.2,314,236 ක ශේෂ පැවතීමෙන් එම අනුපාතයන් ප්‍රකාරවම ද්‍රවශීලතා තත්ත්වයක් නොපවතින බව නිරීක්ෂණය වේ.

## 2.4 ආදායම් පරිපාලනය

### 2.4.1 වරිපනම් හා බදු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) වරිපනම්

ආරම්භක හිඟ ශේෂය රු.1,520,917 ක් වූ අතර, රු.2,162,763 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.3,683,680 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.2,484,596ක් වීම නිසා වර්ෂය අවසානයට රු.1,199,084 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) අක්කර බදු

ආරම්භක හිඟ ශේෂය රු.43,955 ක් වූ අතර, වර්ෂය සඳහා බිල් කර නොතිබුණි. අයවීම් රු.1,075 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.42,880 ක් හිඟව පැවතුණි.

### 2.4.2 බදු කුලී

ආරම්භක හිඟ ශේෂය රු.5,222,407 ක් වූ අතර, රු.5,965,225 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමග රු.11,187,632 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළ මුළු අයවීම් රු.5,485,224 ක් වීමනිසා, වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.5,702,408 ක් විය.

### 2.4.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.2,569,394 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.14,503,308 ක් අයවිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා අරමුදලින් හා ප්‍රාග්ධන ආධාර මත අයවැයගත කර තිබුණ රු.40,000,000ක් වූ කර්මාන්ත 82 කින් එකම කර්මාන්තයක් හෝ සමාලෝචිත වර්ෂය තුළ ඉටු කර නොතිබුණි.

(ආ) අයවැය මගින් අනුමත කර නොතිබුණු කර්මාන්ත 02 ක් ඉටු කිරීම සඳහා 2016 දෙසැම්බර් 27 දින කොන්ත්‍රාත්කරුවෙක් සමඟ රු.4,099,975 ක ඇස්තමේන්තු වටිනාකමට ගිවිසුම් අත්සන් කර තිබුණද එම කර්මාන්ත 02 හි වැඩ,2017 ජුනි 25 දින වන විටත් අවසන් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### 3.2.1 මානව සම්පත් කළමනාකරණය

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත ද්විතියික මට්ටමේ තනතුරු 02 ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක පැවති පුරප්පාඩු පුරවා ගැනීමට හා තනතුරු 04 ක පවතින 05 ක් වූ අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2.2 සේවක ණය

සේවය හැර ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 19 දෙනෙකුගෙන් අයවිය යුතු රු.830,507 ක සේවක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයවී නොතිබුණි. ඉන් රු.52,581 ක් වූ ශේෂ වසර 05 කට වැඩි කාලයක් ඉක්මවා තිබුණි.

## 4. මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභාවට ආසන්නව ඉදි කර තිබූ ගොඩනැඟිල්ලක මලාපවහන පද්ධතිය ගං ඉවුරේ සකස් කර ඇති බව හා ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් අනවසරයෙන් සිදුකරන බව වාර්තා වී තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 4.1 නිෂ්ක්‍රීය/ ඌණ උපයෝජිත වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු එකතු වටිනාකම රු.2,163,996 ක් වූ අක්කර 05 රූඩ් 03 පර්චස් 11 ක් වූ ඉඩම් කැබලි 16 ක් භාවිතයට ගෙන නොතිබුණු අතර, එම ඉඩම්වල මායිම් ලකුණු කර ඉඩම්වල ආරක්ෂාව සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේ සභාවට ලැබී තිබූ පිරිවැය රු.24,928,666 ක් වූ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය එදින සිට නිෂ්කාර්යව පැවතුණ අතර සභාව සතු ඩබල් කැබ් රථ 02 ක්, ටිපර් රථයක්, ත්‍රීරෝද රථයක් සහ අත්ට්‍රැක්ටර් රථයක් සහ ට්‍රැක්ටර් රථ 02 ක් ඌණ උපයෝජිතව භාවිත කර තිබුණි.

## 4.2 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

2016 වර්ෂය තුළ කසල කළමනාකරණය වෙනුවෙන් රු.7,120,916 ක වියදම් දරා තිබුණද, එකතු කරන ලද ටොන් 27,648 ක් පමණ වූ කසළ නගර මධ්‍යයේ ඉඩමකට බැහැර කරමින් පැවතුණි. කසළ බදු අය කිරීම සඳහා 2002 වර්ෂයේ සිට අතුරු ව්‍යවස්ථා පනවාගෙන තිබුණද කසළ බදු අයකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වැය විෂයයන් 08 ක එකතුව රු.19,375,886 ක් වූ ඉතිරි කිරීම්වල ආදායම් විෂයයන් 03 ක ළඟා කර නොගත් ඉලක්කවල එකතුව රු.14,407,062 ක් ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.2 පද්ධති හා පාලනයන්

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් පාලනය

(ඇ) අයවැය පාලනය